**විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලය - 2022**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් හා සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආරෝග්‍යශාලා මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආරෝග්‍යශාලා මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආරෝග්‍යශාලා මණ්ඩලය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආරෝග්‍යශාලා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
ආරෝග්‍යශාලා මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආරෝග්‍යශාලා මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමණාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආරෝග්‍යශාලා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආරෝග්‍යශාලා මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම්කර තිබේද යන බව සහ එකී

පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආරෝග්‍යශාලා මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආරෝග්‍යශාලා මණ්ඩලය ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතුකර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතාකර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 22 ඡේදය ප්‍රකාරව යම් වත්කමක් සඳහා දරන ලද වියදමින් වත්කමෙහි අගය වැඩිවීමක් සිදුවේ නම් එය වත්කමෙහි අගයට එකතු කළ යුතු වුවත් Vitre Ctomy යන්ත්‍රය සඳහා යොදන ලද නව මොඩියුලය සහ ඖෂධාලය, තුවාල සත්කාර ඒකකය එන්ඩොස්කොපි ඒකකය, සැරහුම් කාමරයන්හි විදුලි පද්ධතිය අළුත්වැඩියාව සඳහා වැය කරන ලද රු.8,833,700ක් හා රු.2,605,631ක් ප්‍රාග්ධන ගත නොකර වියදමක් ලෙස වර්ෂයේ ලාභයට එරෙහිව කපාහැර තිබීම හේතුවෙන් වර්ෂයේ ලාභය හා ස්ථාවර වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | මෙම මොඩියුලය ස්ථාපිත කිරීම මඟින් වත්කමේ අගය වැඩි වීමක් සිදු වන බව ලිපිගොනුවේ දක්වා නොමැති අතර මෙය වත්කමේ දැනට පවතින කොටසක ප්‍රතිස්ථාපනයක් (replacement) වන බව දක්වා ඇත. එම නිසා මෙම වියදම පුනරාවර්ථන වියදමක් ලෙස සලකා ගිණුම්ගත කළ බව හා විදුලි පද්ධතියේ අලුත්වැඩියාවක් සිදුකළ බැවින් පුනරාවර්ථන වියදමක් ලෙස සලකා කටයුතු කරන ලද බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවකාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණු නමුත් දැනටත් භාවිතා කරනු ලබන පිරිවැය රු.203,269,478 ක් වූ වත්කම්වල ඵලදායී ජීවකාලය පිළිබඳව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධනයකර නිවැරදි ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතුකර නොතිබුණි. | ශල්‍ය භාණ්ඩ හා පොදු භාණ්ඩ සඳහා මේ වන තුරු කිසිදු උපදෙසක් හෝ එය කරනු ලබන ආයතනයේ හෝ නම් කර ඒවා නැති බව හා ඉඩම්, ගොඩනැගිලි හා වාහන සම්බන්ධයෙන් ප්‍රතිශෝධන කටයුතු සිදුකර 2023 මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත 07 හි 69 ඡේදය පරිදි වත්කම් භාවිතයට ගත් දිනයේ සිට ක්ෂය කිරීම් කළ යුතු වුවත්, ඊට අනුකූල නොවන ලෙස වත්කම භාවිතයට ගත් දිනය නොසලකා මුළු වර්ෂයටම ක්ෂය කිරීමට ගිණුම්කරණ ප්‍රතිපත්තිය සකසා තිබුණි. | ඔබගේ උපදෙස් හා රාජ්‍ය ගිණුම් ප්‍රමිතය අනුව 2023 වසර සිට මිලදී ගත් දින සිට ක්ෂය කිරීමට අදාලව කටයුතු කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 08 හි 100 ඡේදය පරිදි අනාගතයේදී ඇති විය හැකි බැදීම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් කළයුතු වුවත් රෝහලට විරුද්ධව පවරා තිබූ නඩු 02 ක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් කර නොතිබුණි. | අදාල පාර්ශව වෙත ගෙවිය යුතු වේදැයි යන්න අවිනිශ්චිත බැවින් මූල්‍ය වටිනාකම් ගිණුම්වලට ඇතුළත් කර නොමැති බව හා මේ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල සටහන්වලට ඉදිරියේදී දැක්වීමට කටයුතු කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) | විජය කුමාරතුංග අනුස්මරණ රෝහල වෙත 2022 වර්ෂයට අදාලව ලැබී තිබුණු රු.9,500,000ක ප්‍රාග්ධන ප්‍රදාන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 ප්‍රකාරව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය තුළ හෙළිදරව් කර නොතිබුණි. | මෙය මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන නව ආකෘතියේ අවශ්‍යතාවයක් වන බැවින් 2023 වසරට එම නව ආකෘතියට අනුව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විදේශගතවූ වෛද්‍ය නිලධාරිනියකගේ වැටුප් රහිත නිවාඩු අවසන්ව තිබියදී සේවයට වාර්තා නොකිරීම හේතුවෙන් 2019 මාර්තු 08 දින සිට සේවය අතහැර ගියා සේ සලකා කටයුතු කර තිබුණි. මෙම නිලධාරිනියගෙන් අයවිය යුතු රු.652,627 ක බැඳුම්කර වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණු අතර මෙම වාර්තාවේ දින වනවිටත් එම මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම වෛද්‍යවරිය වෙත ලිපි කිහිපයක් මඟින් මෙම ගෙවීම සිදුකරන ලෙස දැනුවත් කර ඇති බව හා රෝහල මඟින් ගෙවිය යුතු පාරිතෝෂිත දීමනාව මෙන්ම B කාඩ්පතද රෝහල සතුව පවතින අතර ඇය වෙනුවෙන් EPF/ETF ආකෘති පත්‍රද නිදහස් කර නොමැති බව. | අයවිය යුතු මුදල කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 756 | සෑම මුදල් වර්ෂයක් අවසානයේදීම සියලුම ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් භාණ්ඩ සමීක්ෂණයක් සිදුකල යුතු වුවත් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් රු.55,155,153 ක වටිනාකමක් ඇති වෛද්‍ය උපකරණ 2021 හා 2022 වර්ෂයන්හි සමීක්ෂණය කර නොතිබුණි. | 2022 වසර සඳහා ශලා භාණ්ඩ සමීක්ෂණය 2023 ජුලි මස 01 වනදා සිට 03 වනදා දක්වා සිදුකරනු ලබන බව. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සියළුම රාජ්‍ය ආයතනවල ඇඟිලි සළකුණු සටහන් කිරීමේ යන්ත්‍ර භාවිතය මඟින් නිලධාරීන් කාර්යාලයට පැමිණීම හා පිටවීම සනාථ කිරීම සම්බන්ධයෙන් වූ වාර්තා තබා ගත යුතු වුවද, රෝහලේ පැමිණීම පිටවීම සනාථ කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කර නොතිබුණි. | මේ පිළිබඳ රෝහලේ කළමණාකාරීත්ව කමිටුවේදී සාකච්ඡා කර සුදුසු ලෙස අදාල කටයුතු සිදුකිරීමට අවශ්‍ය පියවර ගන්නා බව. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.13,175,722 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.7,397,213 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.20,572,935ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සමාලෝචිත වර්ෂයේ වෙනත් වියදම් රු.26,526,790කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2013 මැයි 01 දින ගණකාධිකාරි ලෙස පත්වීම් ලද නිලධාරිනියකගේ සේවය අසාධාරණ හා අයුක්ති සහගත ලෙස අවසන් කිරීම සම්බන්ධයෙන් රෝහලට එරෙහිව මීගමුව කම්කරු විනිශ්වය සභාවේ 2019 ජුලි 30 දින පවරන ලද අංක 21/32/2019 දරන නඩුව සම්බන්ධයෙන් ඇති වූ එකඟතාව අනුව එම නිලධාරිනිය දැනට වෙනත් රැකියාවක නිරත වන බැවින් ඉල්ලා අස්වීමක් ලෙස පිළිගෙන ඉල්ලා අස්වීම ලබාදීමටත් රු.500,000 ක වන්දි මුදලක් ගෙවීමටත් රෝහලට සිදුව තිබුණි. ඒ අනුව රෝහලට වන්දි මුදල් හා නීතිඥ ගාස්තු ලෙස එකතුව රු.690,000 ක නිශ්කාර්ය වියදමක් දැරීමට සිදුව තිබුණි. | සමථයකට පත්වීම සම්බන්ධයෙන් හිටපු ගණකාධිකාරි විසින් කරනු ලැබූ ඉල්ලීම විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සලකා බැලීමෙන් අනතුරුව මෙම නඩුව තව දුරටත් ඉදිරියට පවත්වාගෙන යාම අනර්ථකාරී වියදමක් වන බව තීරණය කළ බැවින් මෙම නිලධාරිනියගේ ඉල්ලීම සලකා බලා මෙම නඩුව සමථ කරනලද බව. | • ඉදිරියේදි මෙවැනි අඩුපාඩු සිදුනොවිමට කළමණාකරනය කටයුතු කළ යුතුය.<br>• ආයතනයට සිදු වූ අලාභය රු.690,000 ඊට වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.2 ප්‍රසම්පාදන කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඖෂධ ගබඩාව පැරණි පවුල් වෛද්‍ය සායනය වෙත ගෙන යාම වෙනුවෙන් වූ රු.1,116,250 ක අළුත්වැඩියා වියදම සම්බන්ධයෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3 මාර්ගෝපදේශ ප්‍රකාරව මුළු පිරිවැය ඇස්තමේන්තු සකසා නොතිබූ අතර 2.14 මාර්ගෝපදේශය ප්‍රකාරව ඒ ඒ මූල්‍ය සීමාවට අදාල අධිකාරී අනුමැතිය ලබා නොගෙන, පිරිවිතර හා මිනුම් හඳුනා ගැනීමකින් තොරව හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමකින් තොරව මෙම කාර්යය රු.100,000ට අඩු වටිනාකම් යටතේ වැඩපත් කොටස් කර එක් සැපයුම්කරුවකු වෙත කොන්ත්‍රාත්තුව ලබා දීමට රෝහලේ අධ්‍යක්ෂවරයා විසින් කටයුතු කර තිබුණි. | මේ සම්බන්ධයෙන් රෝහල් කළමණාකාරීත්වය මේ වනවිටත් අවධානය යොමුකර ඇති අතර මෙවැනි කාර්යයන් ඉදිරියේදී සිදු කිරීමට ක්‍රමවේදයක් මේ වන විටත් සකස් කර ඇති බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2.8.5 (ආ) ඡේදය පරිදි, තත්කාර්යය සඳහා පත්කරන ලද ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව සඳහා විෂය පිළිබඳ දැනුම ඇති විශේෂඥයකුගෙන් සහ අදාල ප්‍රසම්පාදනය පිළිබඳ දැනුම ඇති නිලධාරියෙකුගෙන් සමන්විත වන බවට දෙපාර්තමේන්තු ප්‍රධානියා සෑහීමකට පත්වන්නේ නම් හැර තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත්කල යුතු වුවත් ඊට අනුකූල නොවන ලෙස තාක්ෂණික ඇගයීම් කමිටු පත්කිරීමකින් තොරව ප්‍රාථමික සත්කාර ඒකකයේ විදුලි පද්ධතිය අළුත්වැඩියාව හා පොදු ගබඩාව ඉදිරිපිට භූමිය සැකසීම සඳහා වූ රු.3,395,012 ක අළුත්වැඩියා කොන්ත්‍රාත් පිරිනමා තිබුණි. | ඉදිරියේදී මෙවැනි කොන්ත්‍රාත් සිදු කිරීමේදී තාක්ෂණ ඇගයීම් කමිටු පත්කර කොන්ත්‍රාත් වැඩ කටයුතු සිදු කරන බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) ප්‍රාථමික සත්කාර ඒකකයේ විදුලි පද්ධතිය අලුත්වැඩියාවට අදාල තාක්ෂණික නිලධාරිගේ (විදුලි) 2022 මාර්තු 23 දිනැති ඇස්තමේන්තුවේ වටිනාකම රු.1,791,595 (වැට් රහිත) වුවත් අවසන් බිල්පත්හි වටිනාකම රු.2,605,631ක් විය. මෙම වෙනස්වීමට ප්‍රමාණවත් සාධාරණීකරනයක් ඉදිරිපත් වී නොතිබූ අතර තාක්ෂණික වාර්තාව සම්බන්ධව අමාත්‍යාංශ විදුලි ඉංජිනේරුවරයෙකුගේ නිර්දේශයක් ලබා ගැනීමකින් තොරව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.3 වගන්තිය අනුව උද්ධමනය හෝ වෙනත් කරුණු සැලකිල්ලට ගෙන මුළු පිරිවැය ඇස්තමේන්තුව යාවත්කාලීන කර අදාල අධිකාරිය විසින් අනුමත කිරීමෙන් පසු මිල ගණන් කැඳවීමට කටයුතු කර නොතිබුණි.<br><br>එසේම අළුත්වැඩියාව සඳහා මිල ගණන් කැඳවීමට ප්‍රසම්පාදන කමිටු අනුමැතියකින් තොරව රෝහල් අධ්‍යක්ෂවරයාගේ අත්සනින් යුත් 2022 මැයි 12 දිනැති ලිපියක් සමඟ ලංසු ලේඛන යවා මිල ගණන් ලබා ගැනීමට කටයුතු කර තිබුණි. | ඉදිරියේදී මෙවැනි කටයුතු වලදී ඔබ විසින් ලබා දී ඇති උපදෙස්වලට අනුව විදුලි ඉංජිනේරුවෙකුගේ ද නිර්දේශ ලබා ගැනීමට කටයුතු කරන බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

## 3.1 මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රෝහලේ නඩත්තු අංශයේ සේවය කල නඩත්තු කම්කරු දෙදෙනෙකු හා එක් විදුලි කාර්මිකයෙකු 2021 වර්ෂයේදී එම අංශයෙන් වෙනත් ස්ථාන වෙත මාරුකර තිබීම හේතුවෙන් රෝහලේ තීන්ත ආලේප කිරීම හා අනෙකුත් සුළු නඩත්තු වැඩ බාහිර කොන්ත්‍රාත්කරුවන් වෙත ලබාදීමට සිදුවී තිබුණි. ඒ අනුව රෝහලේ මානව සම්පත් ඵලදායීව භාවිතා කර අවම පිරිවැයකින් කළ හැකිව තිබුණු කාර්යයන් බාහිර පාර්ශවයන්ට ලබාදීමෙන් රෝහලට මූල්‍යමය පාඩුවක් සිදුව තිබුණු බව නිරීක්ෂණය විය. | 2023 මැයි 08 වන දින නඩත්තු අංශය නැවත ස්ථාපිත කර ඇති බව හා ඒ අනුව ඉදිරියේදී රෝහලේ සියලුම සුලු නඩත්තු කටයුතු සහ තීන්ත ආලේප කිරීම වැනි කාර්යයන් එම ඒකකය මඟින් ඉටු කර ගැනීමට කටයුතු කරන බව. | මානව සම්පත් ඵලදායීව භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |